**වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය - 2020**

**-----------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**------------------**

### 1.1 මතය

**-------**

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 47(2) වගන්තිය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

**----------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 4,638,179 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 72,431,126 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 67,792,947 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ඉකුත් වර්ෂයට සාපේක්ෂව පුනරාවර්තන ප්‍රදාන රු. 16,615,455 කින් වැඩි වීමත් මුළු මෙහෙයුම් වියදම් අඩු වීමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2017 ජනවාරි 03 දින පැවති අංක අමප/16/2673/720/030 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව විශ්වවිද්‍යාලය සඳහා වැඩපලක්, නේවාසිකාගාරයක් හා ආපනශාලාවක් ඉදිකිරීම සඳහා රු.මිලියන 927.34 ක ප්‍රතිපාදන අනුමත කර තිබුණි. මෙම ඉදිකිරීම් සඳහා අයවැය මඟින් 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා එකතුව රු.මිලියන 281.36 ක් වෙන් කර දී තිබුණද ඉන් උපදේශන ගාස්තු ලෙස රු.මිලියන 22.5 ක් පමණක් වැයකර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ව්‍යාපෘතිය ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිකිරීම් කටයුත්තේ වෙනස්කම් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර අමාත්‍ය මණ්ඩල සටහන අනුව 2021-2023 මධ්‍යකාලීන අයවැය රාමුව තුලින් සලසා ගන්නා ලෙස යෝජනා කර ඇත. | ප්‍රතිපාදිත මුදල් උපරිම කාර්යක්ෂමතාවයකින් හා සඵලදායීතාවයකින් යුතුව භාවිතා කල යුතුය. |
| (ආ) විශ්වවිද්‍යාලයේ පීය ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව පෞද්ගලික ආයතනයක් වෙත රු. 14,506,548 ක මුදලකට 2016 සැප්තැම්බර් 10 දින ප්‍රදානය කර තිබුණු අතර දින 60 ක් තුල වැඩ අවසන් කරන බව දන්වා 2019 සැප්තැම්බර් 12 වන දින අත්තිකාරම් ලෙස රු. 2,901,285 ක් ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම වැඩ නිම කර නොතිබුණි. මේ සම්බන්ධව ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳ විගණනයට පැහැදිලි නොකෙරුණි. | මේ වනවිට ඉතිරි වැඩ කටයුතු අදාල කොන්ත්‍රාත් ආයතනය විසින් සිදු කරමින් පවතින අතර මෙම ව්‍යාපෘතිය මෙම වර්ෂයේ දෙවන කාර්තුව අවසන් වීමට ප්‍රථම අවසන් කරන ලෙස දන්වා ඇත. | ව්‍යාපෘතියේ වැඩ කටයුතු කඩිනමින් නිම කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ බහුකාර්ය ශබ්දාගාර සංකීර්ණයක් හා දේශනශාලා සංකීර්ණයක් සහිත ගොඩනැගිල්ලක් ඉදිකිරීමට 2011 අප්‍රේල් 27 දිනැති අංක අමප/11/2152/539/017-1 දරන අමාත්‍ය මණ්ඩලයෙන් අනුමැතිය ලබාදී තිබුණි. භාණ්ඩාගාරයෙන් හා ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය මඟින් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා දක්වා ප්‍රතිපාදන රු. මිලියන 434.9 කින් රු. මිලියන 304.5 ක් පමණක් වියදම් කර තිබුණි. 2020 මාර්තු 10 දිනැති බහුකාර්ය ගොඩනැගිල්ලේ ප්‍රගති | ශබ්දාගාරයේ ඉදිකිරීම්වලට අදාල අඩුපාඩු හඳුනාගෙන එම ගොඩනැගිල්ලේ තාක්ෂණික උපදේශන සහ ඉදිකිරීම් කටයුතු සිදුකරන ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙත දැනුම් දෙන ලද අතර, ඔවුන් විසින් මේ වනවිට අදාල අඩුපාඩු සකස් කරමින් යන අතරතුර අවස්ථානෝචිතව භාවිතයට ගන්නා බව දැනුම් දෙමි. | ශබ්දාගාරයේ වැඩ කටයුතු කඩිනමින් නිම කිරීමට කටයුතු කල යුතුය. |

වාර්තාවේ සඳහන් කර තිබූ ශබ්දාගාරයේ පැවති අඩුපාඩු හේතුවෙන් විගණිත දිනය වූ 2021 පෙබරවාරි 15 වන විටත් ශබ්දාගාරය භාවිතයට ගතහැකි තත්වයට නිමකර නොතිබුණි.

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අනුමත කාර්යමණ්ඩලයට ඇතුළත් නොවූ උපදේශක තනතුරු 02 ක් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව 2019 හා 2020 වර්ෂයන්හිදී කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් දෙදෙනෙකු බඳවාගෙන ඔවුන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු.6,944,804 ක දීමනා ගෙවා තිබුණි. | අවශ්‍යතාවය සලකා බලා පුරප්පාඩු කථිකාචාර්ය තනතුරු සඳහා කුසලතා සහිත පුද්ගලයන් බඳවාගන්නා තෙක් සේවා කොන්ත්‍රාත් පදනමින් මෙම උපදේශකවරුන්ගේ සේවය ලබාගැනීමට කටයුතු කරන ලදී. | නව තනතුරු ඇති කිරීමට හා බඳවාගැනීම් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය. |
| (ආ) පශ්චාත් උපාධියක් හැදෑරීම සඳහා විදේශ අධ්‍යයන නිවාඩු ලබාගෙන තිබූ ගුරු සහයකවරයෙකු අධ්‍යයන නිවාඩු අවසන් කර 2012 ජුනි 30 දින සිට සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් 2013 ජනවාරි 01 දින සිට සේවය හැරගියා සේ සලකා කටයුතු කර තිබුණි. ඒ අනුව ඔහුගෙන් අයවිය යුතු රු.1,553,825 ක්වූ බැඳුම්කර වටිනාකම අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | බැඳුම්කර වටිනාකම අයකර ගැනීමට නඩු පැවරීම සිදු කරන ලදී. | බැඳුම්කර වටිනාකම නොපමාව අයකර ගැනීමට කටයුතු කල යුතුය. |